**ශීර්ෂය 264 - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**
**-----------------------------------------------------------**

**1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

(අ) දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා පරිගනක ජාල සැපයීම, අභ්‍යන්තර හා බාහිර ජාල හඳුන්වාදීම

(ආ) රාජ්‍ය නිලධාරීන්ගේ නිලතල අනුව මධ්‍යකාලීන පුහුණු කිරීම

(ඇ) යාපනය දිස්ත්‍රික්කයේ නිෂ්පාදනයන්ට ප්‍රමාණවත් භෞතික හා මූල්‍ය සැපයුම් ලබාදෙමින් සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(ඈ) දිළිඳු රේඛාවෙන් පහළ සිටින ජනයාට අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් ලබාදීම හා ඔවුන්ගේ අධ්‍යාපන තත්ත්වය ඉහළ නැංවීමට ජීවනෝපාය මාර්ග සඳහා ආධාර උපකාර ලබාදීම

(ඉ) මහජනයාට හොඳ භාණ්ඩ හා සේවාවන් සැපයීම සහතික කරමින් ගම්, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් උපත්, විවාහ හා මරණ ලියපදිංචි කිරීම කඩිනම් කිරීම වැනි සේවාවන් ජනතාවට ලබාදීම.

(ඊ) ආපදා කළමනාකරණ සේවා ඒකකයන් මගින් ගම් මට්ටමේ කමිටු පත්කිරීම හා කඩිනම් සහන කටයුතු එසැනින් ලබාදීම.

(උ) කාලානුරූපීව සංස්කෘතික උත්සව පවත්වමින් සාම්ප්‍රදායික සංස්කෘතික වටිනාකම් හා ව්‍යාපාරයන් සංරක්ෂණය හා ආරක්ෂා කිරීම

(ඌ) මැතිවරණ කටයුතු සම්බන්ධීකරණය

**1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

(අ) ඩෙල්ෆ්ට්

(ආ) වේලනෙයි

(ඇ) කරෙයිනගර්

(ඈ) කයිට්ස්

(ඉ) යාපනය

(ඊ) නල්ලූර්

(උ) වලිකාමම් නිරිත

(ඌ) වලිකාමම් බටහිර

(එ) වලිකාමම් දකුණ

(ඒ) වලිකාමම් උතුර

(ඔ) වලිකාමම් නැගෙනහිර

(ඕ) තෙන්මාරච්චි

(ක) වඩමාරච්චි නිරිත

(ග) වඩමාරච්චි උතුර

(ජ) වඩමාරච්චි නැගෙනහිර

## 1.3 විෂය පථය

-------------

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 10 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, අනෙකුත් ව්‍යවස්ථාපිත විධිවිධාන සහ රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.5 විගණන නිරීක්ෂණය**

-----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.15 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම්වලින් ඇති වන බලපෑම හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

--------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ආදායම් ගිණුම් 2014 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

-----------------------------------------

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| විශ්‍රාම අධිහාර ලේඛණය | 4:4(II) කච්චේරි මාර්ගෝපදේශක අත්පොත |
| විවිධ වර්ගයේ විශ්‍රාම වැටුප් ලේඛණය | 4:2(I) කච්චේරි මාර්ගෝපදේශක අත්පොත |
| උපපත්‍රිකා පොත් ලේඛණය | 5:10 කච්චේරි මාර්ගෝපදේශක අත්පොත |
| පොත් නාමාවලිය | 5:9 කච්චේරි මාර්ගෝපදේශක අත්පොත |
| දුරකථන ලේඛණය | 846(3),845(1) මුදල් රෙගුලාසිය |
| පරිපූරක ලේඛණය | 533 මුදල් රෙගුලාසිය |
| සුරක්ෂිතාගාර පොත | 533 මුදල් රෙගුලාසිය |
| නොගෙවූ වැටුප් ලේඛණය | 290(1) මුදල් රෙගුලාසිය |
| හානි පිළිබඳ ලේඛණය | 110 මුදල් රෙගුලාසිය |
| චෙක්පත් ලේඛණය | 533 මුදල් රෙගුලාසිය |
| වාහන දෛනික ධාවන සටහන්පත් | 1646, 1647 මුදල් රෙගුලාසිය |

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ එකතුව රු.11,003,201 ක් වූ ගනුදෙනු 228 ක් වැඩ නිමකළ වාර්තා, මිල ගණන්, ප්‍රසම්පාදන තීරණ, ඉන්වොයිසි, ලදුපත්, ඉන්වෙන්ට්‍රි සහතික, අමතර ඉන්ධන අනුමත කරගැනීම් සහ අනුමත කිරීමේ ලිපි යනාදිය නොලැබීම මත සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**(ඇ) විසර්ජන ගිණුම්**

(i) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 608,793,833 ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු608,134,414 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 659,419ක් හෙවත් සියයට 0.11ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 563,943,833 | 563,517,243 | 426,590 | 0.08 |
| මූලධන | 44,850,000 | 44,617,171 | 232,829 | 0.52 |
| එකතුව | 608,793,833 | 608,134,414 | 659,419 | 0.11 |

(ii) **අයවැය විචලනය**

- වැය විෂයයන් 8 ක් සඳහා සළසා තිබුණු රු.10,113,701 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.
- වැය විෂයයන් 10 ක් සඳහා අධිපතිපාදන සළසා තිබිම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5.1 සිට සියයට 80 දක්වා වු පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.
- වැය විෂයයන් 10 ක් සඳහා වු ඉතිරිය රු.10,414,779 ක් සඳහා සෑහීමට පත්විය හැකි හේතු ඉදිරිපත් නොවීය .

(iii) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 18 ක් හා දෙපාර්තමේන්තු 16 ක් විසින් එකතුව රු.4,333,008,649 ක් වු ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර ඉන් රු.4,271,576,186 ක් උපයෝජනය කර තිබුණි. මේ අනුව, ඉතිරිය ලබා දී තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් රු.61,432,463 ක් හෝ සියයට 1.42 ක් වී තිබුණි.

(iv) **ආදායම් ගිණුම**

---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මුදල් රෙගුලාසි 128(2)(ඇ) ප්‍රකාරව හිඟ ආදායම් ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
- මාර්ග බලපත්‍ර නිකුත් කිරීමෙන් රැස් කරන ලද එකතුව රු.28,952,611 ක් වූ ආදායම්වලින් රු.5,945,219 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් උපයෝජනය කර තිබුණි. රු.23,007,392 ක් වූ ශේෂය පොදු තැන්පත් ගිණුමේ දිගු කාලයක සිට රඳවා තබා තිබුණි.

(v) **රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

-------------------------------------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සිමාවන්**

---------------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 26401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 43,000,000 | 40,915,367 | 25,000,000 | 32,787,932 | 110,000,000 | 102,355,969 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවිම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.581,901 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ආපදා ණය ගෙවීමේදි පිළිපැදිය යුතු විධිවිධාන අනුගමනය නොකර රු.24,655,399 ක ණය ගෙවා තිබුණි.
- දෙපාර්තමේන්තු පොත් හා මහා භාණ්ඩාගාරයේ පරිසනක මුද්‍රිත පිටපත් සැසදීම් ප්‍රකාශය අතර රු.47,464 ක වෙනසක් නිරීක්ෂණය විය. වර්ෂ 17 සිට වර්ෂ 19 දක්වා කාල පරාසයකදී මෙම වෙනස හඳුනාගෙන නිරාකරණය කිරීමට කටයුතු කර නොතිබුණි.
- 1988 අගෝස්තු 30 දිනැති අංක 29/88 දරන රාජ්‍ය පරිපාලය චක්‍රල්බයේ14:1 ඡේදයට පටහැනිව නිලධාරීන් 05 දෙනෙකුට එකතුව රු.2,749,920 ක් වූ වසර 2 ක ණය ලබාදී තිබූ අතර මේ සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.
- 1988 අගෝස්තු 30 දිනැති අංක 29/88 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 14:5 ඡේදයට පටහැනිව මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු වෙත රු.751,680 ක වර්ෂ දෙකක ණය ලබාදී තිබුණු අතර මේ සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.
- දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පරිසණක මුද්‍රිත සටහන් අතර දැක්වෙන රු.38,782 ක වෙනස කපා හැරීම සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය 1999 ඔක්තෝබර් 18 දිනැති අංක 369 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව ලබාගෙන නොතිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම්**

-----------------

(i) මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානවලට පටහැනිව මාණ්ඩලික නොවන නිලධාරීන්ට අවස්ථා 3 ක දී එකතුව රු.110,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම ගෙවා තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිම කළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, කාර්යය නිම වී මාස 01 සිට මාස 09 දක්වා කාල ප්‍රමාදයකින් පසුව එකතුව රු.983,971 ක අතුරු අග්‍රිම නිරවුල් කර තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරකදි ගෙවිය හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.20,000 ක් වුවත් එම රෙගුලාසිවලට පටහැනිව අවස්ථා 14 ක දී රු.20,000 ඉක්මවූ එකතුව රු.1,513,126 ක තත්කාර්ය අතුරු අග්‍රිම ගෙවා තිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම**

**----------------------**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(i) වසර ගණනාවක් ඉක්ම වූ රු. 3,030,586 ක් වූ පැමිණිලිකරුවන්ගේ මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර වයස් විශ්ලේෂණයක්ද විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) වර්ෂ දෙකක් ඉක්ම වූ රු. 16,047 ක් වූ රඳවා ගැනීමේ මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.10,441,618 ක මුදල් අදාල කාර්යයන් සඳහා උපයෝජනය කිරීමකින් තොරව මාස 01 සිට මාස 33 අතර කාල පරිච්ඡේදයක් දක්වා පොදු තැන්පත් ගිණුමේ තබා තිබුණි.

(iv) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලෙජර් පොත්වල හා මහා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අතර රු.22,046,383 ක් වූ වෙනසක් නිරීක්ෂණය වූ අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(v) ගොඩනැගිලි ඉදිකිරීම් සහ පුනරුත්තාපනය හා පරිපාලන වියදම් සඳහා රු. 20,499,908 ක මුදලක් පොදු තැන්පත් ගිණුමෙන් වැය කර තිබුණි. කෙසේ වුවද, මෙම තැන්පතු පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවීය.

(vi) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් විසින් රැස් කරන ලද රු. 147,942 ක් වූ මුදල් පරිත්‍යාග, මුදල් රෙගුලාසි 170(2) ප්‍රකාරව කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි.

## 1.6 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

-----------------------------------

### 1.6.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---------------------------

2010 මාර්තු 10 දිනැති අංක PF/R/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.

### 1.6.2 වාර්ෂික කාර්යසාධනය වාර්තාව

-------------------------------

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ (ඇ)ඡේදය සහ 2002 සැප්තැම්බර් 12 සහ 2004 පෙබරවාරි 20 දිනැති පිළිවෙලින් අංක 402 හා 402 (1) දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කාර්යසාධන වාර්තාව 2013 සැප්තැම්බර් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 1.6.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

---------------------------------

2006 මාර්තු 24 දිනැති අංක/128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත් එය රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2013 දෙසැම්බර් 31 දින වන විටත් අනුමත කර නොතිබුණි.

### 1.6.4 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

--------------------------------------------------------

2006 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009(I) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් මාස තුනකට වරක් පැවැත්විය යුතු වූවත් සමාලෝචිත වර්ෂය තුළදි කමිටු රැස්වීම් තුනක් පමණක් පවත්වා තිබුණි.

## 1.7 වත්කම් කළමනාකරණය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරන ලද නිල වාහන 46 ක වටිනාකම තක්සේරු කර සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමට ගෙන නොතිබුණි.

(ආ) කරෙයිනගර්හි පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල පුද්ගලික ඉඩමක ඉදිකර තිබුණි. කෙසේ වුවද, මෙම ඉඩමේ හිමිකාරීත්වය දිස්ත්‍රික් ලේකම් වෙත මාරු කර නොතිබුණි.

(ඇ) කරෙයිනගර්හි පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂයේ විවෘත කරනු ලැබුවද එහි ඓතිහාසික පිරිවැය හෝ පොත් අගය විගණනය වෙත 2014 සැප්තැම්බර් 30 වන විටත් ඉදිරිපත් නොවීය.

## 1.8 අනුකූල නොවීම්

### නීතී, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවිම

නියැදි විගණන පරීක්ෂණවලදි නිරික්ෂණය වු නීතී, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීතී,රීති සහ රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවිම |
| --- | --- | --- |
| | රු. | |
| **(අ) භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| (i) 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන චක්‍රලේඛය | | ස්ථාවර වත්කම් ලේඛනය නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය | | පරිඝණක, පරිගනක උපාංග හා මෘදුකාංග සඳහා වන ලේඛනය නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| (i) 2008 මැයි 28 දිනැති අංක 428 දරන චක්‍රලේඛය | 10,000 | සුළු මුදල් අග්‍රිමය රු. 7500 ඉක්මවා ගෙවු අවස්ථාවක් නිරීක්ෂණය විය. |

| | | |
|---|---|---|
| (ii) 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන චක්‍රලේඛය | 51,209 | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව විද්‍යුත් මාධ්‍ය භාවිතය (electronic media), දුරකථන ණය පහසුකම් ලබා ගැනීම (share credit facilities) හා ජාත්‍යන්තර සෘජු ඇමතුම් (IDD පහසුකම්) ලබා ගැනීම් ප්‍රතිපූර්ණය කර තිබුණි. |

**(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**

| | | |
|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 69(2) | 16,800,000 | පුනරාවර්තන වැය විෂයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමේදි පූර්ව අධිකාරී බලය ලබා ගැනීමට නොහැකිවීම පිළිබඳ සෑහීමකට පත්විය හැකි හේතු ඉදිරිපත් නොවීය. |
| (ii) මුදල් රෙගුලාසි 94 | 680,725 | අනුමත ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 104(3), (4) | 230,567 | වාහන දෙකක් අනතුරට ලක් වී තිබුණු අතර හානි හා පාඩු පිළිබඳ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 110 | 4,522,321 | හානි හා පාඩු පිළිබඳ ලේඛණය නිසිලෙස නඩත්තු කර නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 396(ඇ) | 363,022 | මාස 06 ක් ඉක්ම වූ ඉදිරිපත් නොකළ චෙක් පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| (i)1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | 7,787,459 | රාජකාරී වාහනවල ඉන්ධන පරිභෝජනය පිළිබඳ සෑම මාස 06 කට වරක් ම පරීක්ෂා කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii)2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛය | 2,889,264 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 කට වෙන් කළ වාහනවල දෛනික ධාවන සටහන් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | 75,554 | දිස්ත්‍රික් ලේකම්වරයාගේ නිල වාහනය සඳහා සමාලෝචිත වර්ෂයේ දී ලබා ගත් අතිරේක ඉන්ධන ලීටර් 632 සඳහා ආර්ථික හා සංවර්ධන අමාත්‍යාංශ ලේකම්වරයාගේ පෞද්ගලික අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| | 227,729 | දිස්ත්‍රික් ලේකම්වරයාගේ නිල වාහනය සඳහා සමාලෝචිත වර්ෂයේ දී ලබා ගත් අතිරේක ඉන්ධන ලීටර් 1,877 සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ පෞද්ගලික අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (iii)2013 ඔක්තෝබර් 09 දිනැති අංක 21/2013 දරන චක්‍රලේඛය | 46,752 | දිස්ත්‍රික් ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයේදි රජයේ නිවාඩු දින 20 ක් සේවය කිරීම වෙනුවෙන් ආර්ථික හා සංවර්ධන අමාත්‍යාංශ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

( ඉ) **ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛ**

**--------------------------------------**

| | | |
|---|---|---|
| 2013 මාර්තු 28 දිනැති අංක 1/2013 දරන විමධ්‍යගත අයවැය චක්‍රලේඛය | 285,000 | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව කෘෂිකාර්මික උපකරණ මිලදී ගැනීම් සඳහා ගෙවීම් කර තිබුණි. |

(ඊ) **ප්‍රසම්පාදන මාර්ගෝපදේශය**

**--------------------------------**

| | | |
|---|---|---|
| (i)5.4.11 මාර්ගෝපදේශය | 852,110 | එකතු කළ අගය මත බදු මුදල් පිළිබඳ විස්තර ඊලඟ මාසයේ 15 වැනි දිනට පෙර දේශීය |

| | | |
|---|---|---|
| | | ආදායම් කොමසාරිස් ජනරාල් හා විගණකාධිපතිට දැනුම්දී නොතිබුණි. |
| (ii)3.8 මාර්ගෝපදේශය | 144,000 | කරෙයිනගර්හි පිහිටි දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීම වෙනුවෙන් භාෂා තුනෙන්ම අනුස්මරණ පුවරුව සකස් කිරීමේදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණි. |

## 1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති අනුමත නොකර අතහැර දැමීම සහ ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වු අවස්ථා පහත දැක්වේ.

(අ) <u>ව්‍යාපෘති ආරම්භ නොකර අතහැර දැමීම.</u>

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රතිපාදන සළසා තිබුණද, සමාලෝචිත වර්ෂයේදී අදාළ ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| | රු. | | |
| කාන්තා නේවාසිකාගාරය - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වඩමාරච්චි නැගෙනහිර | 10,000,000 | 2013 | කෙරීගෙන යන වැඩ නිම කිරීමට ප්‍රමුඛතාවය ලබාදී ඇත. මේ නිසා කෙරීගෙන යන ව්‍යාපෘතිවලට ප්‍රතිපාදන මාරු කිරීමට තීරණය කරන ලදී. |
| රියදුරු නේවාසිකාගාර දෙකක් ඉදිකිරීම - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. | 3,000,000 | 2013 | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| නේවාසිකාගාර ඉදිකිරීම - තෙන්මාරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2,000,000 | 2013 | - | එම - |
| නේවාසිකාගාර ඉදිකිරීම- වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2,000,000 | 2013 | - | එම - |
| නේවාසිකාගාරය ඉදිකිරීම- වලිකාමම් උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2,000,000 | 2013 | - | එම - |
| නේවාසිකාගාරය ඉදිකිරීම- කරෙයිනගර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2,000,000 | 2013 | - | එම - |

**(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

**------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ අදියර III සඳහා රු. මිලියන 11.7 ක්ද, අදියර IV සඳහා රු. මිලියන 4.9 ක් ද ඇස්තමේන්තු කර 2013 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණත්, 2014 ජුලි 24 දින වන විටත් අදියර III හි භෞතික ප්‍රගතිය සියයට 75 ක් හා මූල්‍යමය ප්‍රගතිය සියයට 60 ක් ද, අදියර IV හි භෞතික ප්‍රගතිය සියයට 35 ක් පමණක් ද නිරීක්ෂණය විය.

## 1.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

**------------------------------------**

<u>ගැලපුම් කළ යුතු ශේෂ</u>

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2013 දෙසැම්බර් 31 දිනට පිළියෙළ කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශයේ මාස 06 ඉක්ම වූ නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ රු. 363,022 ක චෙක්පතක් දක්නට ලැබුණි.

## 1.11 අවිධිමත් ගනුදෙනු

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැර වීම

---------------------------------------------------------------

(i) වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අලුත්වැඩියා කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 මාර්ගෝපදේශය අනුගමනය කිරීමකින් තොරව ග්‍රාමීය සංවර්ධන සමිතියකට රු.800,000 ක ඇස්තමේන්තුගත පිරිවැයකට පිරිනමා තිබුණි. මේ පිළිබඳ පරීක්ෂාවකදී තහවුරු වුණේ අයිතම 11 ක් ප්‍රමාන බිල්පත්‍රයේ වැඩියෙන් මැනීම් කර තිබූ අතර මේ හේතුවෙන් රු.207,718 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී පවත්වන ලද පුහුණු වැඩසටහන් 2 ක සංග්‍රහ කටයුතු සඳහා වූ මිලදී ගැනීම්වලදී 2013 දෙසැම්බර් 30 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණයට පටහැනි ලෙස සැපයුම්කරුවෙකුට රු.46,000 ක මුදලක් ගෙවා තිබුණි.

### (ආ) අධිකාරී බලය නොමැති වූ ගනුදෙනු

------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්තව සිවිල් ඉංජිනේරුවරයෙකු සේවයේ යෙදී සිටියදී 2013 ජුනි 10 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත සම්මන්ත්‍රන ශාලාව අධීක්ෂණය සහ ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සඳහා ඉංජිනේරු උපදේශකවරයෙකු සහ කාර්මික නිලධාරියෙකු සේවයේ යොදවා ඇති අතර ඒ සඳහා පොදු තැන්පත් ගිණුමෙන් රු.180,000 ක් ගෙවා තිබුණි. මේ සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) යාපනය දිස්ත්‍රික් පළාත් පාලන සීමා නිර්නය කිරීමේ කමිටුවේ සභාපතිවරයාට 2013 පෙබරවාරි 27 දිනැති අංක PC/7/5/8/1 දරන පළාත් පාලන සහ පළාත් සභා ලේකම්වරයාගේ ලිපියට පටහැනිව රු.7,097 ක දීමනාවක් ගෙවා තිබුණි.

**(ඇ)** **වෙනත්**

------------

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඇස්තමේන්තු ප්‍රතිපාදන මුදල් වෙන්කර නොමැති වුවද නෙස්ටි (Nextea) සහ නෙස්ටි කොප්ප මිලදී ගැනීම වෙනුවෙන් රු.28,240 ක මුදලක් වැයකර තිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම්වරයාගේ නිවස සඳහා සමාලෝචිත වර්ෂයේදී ‘ඉන්ධන ගෑස් ‘(Fuel Gas) මිලදී ගැනීම සඳහා රු.40,400 ක් වැය කර තිබුණි.

(iii) 2013 නොවැම්බර් මාසයේදි පවත්වන ලද වැඩසටහනක් වෙනුවෙන් සම්පත්ලාභීන් 5 දෙනෙකු සඳහා පැයකට රු.700 බැගින් පැය හයක් සඳහා රු.4,200 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

**1.12** **වංචනික ස්වරූපයේ ගනුදෙනු**

----------------------------------

වලිකාකම් නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ළමා විය සංවර්ධන මධ්‍යාස්ථාන 3 කට භාණ්ඩ ලබාගැනීම සඳහා 2012 ඔක්තෝබර් 30 දින ළමා කාර්යාලයෙන් රු.200,000 ක මුදලක් ලබාගෙන තිබුණද කිසිදු භාණ්ඩයක් මෙම මධ්‍යාස්ථාන වෙත ලබාදී නොතිබුණි.

**1.13** **පාඩු හා හානි**

-------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කාර්යාලය පිහිටි ස්ථානය මාරු කිරීම හේතුවෙන් විසර්ජන ගිණුමේ රු.4,522,321 ක පාඩුවක් පෙන්නුම් කළ ද, ඒ පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවීය.

(ii) 1998 වර්ෂයේ සිට පැවත එන අයිතමයන් 284 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමට ගෙන නොතිබුණි.

## 1.14 කළමනාකරණ දුර්වලතා

දිස්ත්‍රික් ලේකම්වරයා ඇතුළු නිලධාරීන් 24 දෙනෙකු සඳහා පුද්ගලික නාවුක මඟී සේවාවක වැඩ කටයුතු සිදු කිරීම හේතුවෙන් රු.මිලියන 3.425 ක ප්‍රසාද දීමනා ගෙවා තිබුණ ද මේ සඳහා අනුමත ප්‍රසාද දීමනා ගෙවීමේ ක්‍රමයක් නොවීය. 2009 මාර්තු මස වන විට මෙම නාවුක මඟී සේවාව නවතා දමා තිබුණද ඒ වන විටත් වැටුප්, අතිකාල හා වෙනත් දීමනාවලට අමතරව දිනකට රු.500 බැගින් වූ දැනටමත් ගෙවා තිබූ රු.මිලියන 3.325 ක් වූ මුදල 2014 ජනවාරි 23 දිනැති රජයේ ගිණුම් කාරක සභා නිර්දේශ හා උපදෙස් පරිදි අයකර ගතයුතු වුවද මෙම මුදල් අයකර ගෙන නොතිබුණි.

## 1.15 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 42 | 44 | - | 02 |
| (ii) | තෘතියික මට්ටම | 21 | 19 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 755 | 691 | 64 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 195 | 185 | 10 | - |
| | එකතුව | 1013 | 939 | 76 | 02 |

පුරප්පාඩු 76ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල කටයුතු කර නොතිබුණි.